

සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.04



නිපුනතාවය - නාට්‍ය හා රංග කලාව විෂය බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජිත පසුබිම ගවේෂණය කරයි.

නිපුනතා මට්ටම - ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි.

පාඩම - දෙමළ ජනයාගේ ආගමික හා සංස්කෘතික උත්සව

කාලච්ඡේද - 02 (විනාඩි 80)

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01). දෙමළ ජනයාගේ ආගමික හා සංස්කෘතික උත්සව වලට අයත් වන්නේ,
1. කෝවලන් හා විලාසම්
2. කාමන් කුත්තු හා කන්නගි කුත්තු
3. සූරන් පෝ හා වඩමෝඩි
4. තෛපොංගල් හා මාඩුපොංගල්
5. මහාශිව රාත්‍රි හා මකීඩ්

(02). හිංදු දෙවඟනන් උදෙසා පැවැත්වෙන උත්සවය වන්නේ,
1. මහාශිවරාත්‍රි උත්සවය
2. තෛපොංගල් උත්සවය
3. නව රාත්‍රි උත්සවය
4. දීපවාලි උත්සවය
5. මාඩුපොංගල් උත්සවය

(03). ජනවාරි මාසයේ පැවැත්වෙන හිංදු ආගමික උත්සව වන්නේ,
1. දුර්ගා හා මහා කාලි පූජාව
2. මහා ශිව රාත්‍රිය හා දීපාවලි
3. තෛපොංගල් හා නව රාත්‍රිය
4. මාඩුපොංගල් හා තෛපොංගල්
5. දීපාවලි හා මහා කාලී පූජාව

(04). හින්දු ආගමික උත්සවයක් හා සම්බන්ධ වන්නේ,
1. මාරි අම්මා හා නවරාත්‍රි මංගල්‍යය
2. කාන්තන් හා අනංග දෙවියා
3. අනංග දෙවියා හා නව රාත්‍රි මංගල්‍යය
4. විජයතසම් හා නවරාත්‍රි මංගල්‍යය
5. තෙන්මෝඩි හා විජයතසම්

(05). හින්දු බැතිමතුන් දීපවාලි උත්සවය සමරන්නේ,
1. දුර්ගා, ලක්ෂමී, සරස්වතී අරගලය පදනම්වය
2. නරකාසුරයාගේ මරණය සැමරීම පිණිසය
3. විෂ්ණු හා බ්‍රහ්ම අතර වඩාත් උසස් කවුරුදැයි ඇති වූ වාදය සැමරීමටමය.
4. සූර්ය වන්දනය පිණිසය
5. සශ්‍රීකත්වය අපේක්ෂාවෙනි.



සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.05



නිපුනතාවය - නාට්‍ය හා රංග කලාව විෂය බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජිත පසුබිම ගවේෂණය කරයි.

නිපුනතා මට්ටම - ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි.

පාඩම - කුත්තු නාට්‍යය

කාලච්ඡේද - 02 (විනාඩි 80)

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01). කුත්තු සම්බන්ධයෙන් නොගැලපෙන වරණය තෝරන්න.
1. කුත්තුවේ විවිධ චරිත සඳහා අනන්‍යය වූ වේෂ භූෂණ ඇත.
2. එක් එක් චරිතයට ආවේනික නර්තන විලාශ ඇත.
3. කුත්තු රඟ දක්වන්නේ ගෘහස්ත වේදිකාවකය.
4. කුත්තුවලට වස්තු විෂය වී ඇත්තේ මහා භාරතය, රාමායනය, හා වෙනත් දක්ෂිණ භාරතීය කෘතිවල එන කතාය.
5. නාට්‍ය මෙහයවන්නා අන්නාවියර් නමින් හැඳින්වේ.

(02). වඩමෝඩි සඳහා භාවිතා කරනු ලබන 'කලරි' නම් වේදිකාව,
1. තුන් පැත්තකින් ආවරණ වූ හතරැස් වේදිකාවකි.
2. කෝවිල අසල බිම් කඩකි.
3. වෘත්තාකාර සමතලා බිමකි.
4. වෘත්තාකාර උස් වේදිකාවකි.
5. අස්වැන්න නෙළාගත් කුඹුරකි.

(03). උතුරු හා දකුණු ශෛලීන් වශයෙන් හැඳින්වෙන්,
1. වඩමෝඩි හා තෙන්මෝඩි
2. කාන්තවරයායන් කුත්තු හා මකීඩ්
3. වඩිමෝඩි හා කාමන් කුත්තු
4. කෝවලන් හා වසන්තන් කුත්තු
5. විලාසම් හා වඩපාංග

(04). 'මකීඩ්' යන ජන නාට්‍ය විශේෂයට අයත් නොවන ලක්ෂණය වන්නේ,
1. සොකරි කතා පුවත හා සැසඳීම.
2. සංවාද, නැටුම්, ගැයුම් මගින් ප්‍රශ්නෝත්තර විලාසයෙන් රංගය ඉදිරිපත් කිරීම.
3. කර්ණාටක සංගීතය භාවිතය
4. හිටිවන දෙබස්, විහිළු අඩංගු වීම
5. දිවා කාලයේ රඟ දැක්වීම.

(05). කාන්ත වරයාන් කුත්තු හ සම්බන්ධ වන්නේ,
1. මාරි අම්මා සහ කාන්තන්
2. මාරි අම්මා සහ තෙන්මෝඩි
3. කාන්තන් සහ රතී දෙවඟන
4. කාන්තන් සහ අනංගදෙවියා
5. අනංග දෙවියා සහ තෙන්මෝඩි



සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.06



නිපුනතාවය - නාට්‍ය හා රංග කලාව විෂය බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජිත පසුබිම ගවේෂණය කරයි.

නිපුනතා මට්ටම - ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි.

පාඩම - කූත්තු නාට්‍යය II

කාලච්ඡේද - 02 (විනාඩි 80)

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01). නර්තනයෙන් බැහැර වූ නාටකීය ලක්ෂණ වලට වැඩි නැඹුරුතාවයක් දක්වන රංග විශේෂය වන්නේ,
1. විලාසම්
2. කාමන් කූත්තු
3. පොන්නු සංකර්
4. අර්ජුනන් තපසු
5. වඩපාංග

(02). තිරුවිලා නම් ආගමික උත්සවය මුල් කර ගනිමින් රඟ දක්වනු ලබන කාමන් කූත්තු පවත්වනු ලබන්නේ,
1. ජනවාරි - පෙබරවාරි
2. මාර්තු - අප්‍රේල්
3. මැයි - ජූනි
4. ජූලි - අගෝස්තු
5. නොවැම්බර් - දෙසැම්බර්

(03). වසන්තන් කූත්තු සම්බන්ධයෙන් නොගැලපෙන වර්ණය වන්නේ,
1. කෘෂිකාර්මික ජන ජීවිතය හා සම්බන්ධවීම.
2. ලී කෙලියට සමාන නර්තනයකි.
3. මද්දලය හා තාලම්පොට වාද්‍ය භාණ්ඩ වේ.
4. කාන්තාවන් පමණක් සහභාගී වේ.
5. 6 - 12 අතර පිරිසක් රංගනයට දායක වේ.

(04). කාමන් කූත්තු හා සම්බන්ධ වන්නේ,
1. මාරි අම්මා, කාන්තන්, තෙන්මෝඩි
2. දුර්ගා, ලක්ෂමී, සරස්වතී
3. විෂ්ණු, බ්‍රහ්ම, ශිව
4. අනංග, මන්මදන්, රතීදෙවගන
5. දුර්ගා, විෂ්ණු, සරස්වතී

(05). විශ්ව විද්‍යාල දෙමළ නාට්‍ය සඳහා මූලික වශයෙන් තේමා කොට ගන්නා ලද්දේ,
1. සාමාන්‍ය ජීවිතයේ හමුවන චරිත, කුල ආගම් ආදී සමාජ ප්‍රශ්න
2. මාරි අම්මා දේවිය හා ඇගේ පුත්‍රයා සම්බන්ධ අභිචාර
3. කෘෂිකාර්මික ජන ජීවිතය
4. ජනවාර්ගික සංක්‍රමණ
5. රාමායනය, මහා භාරතයෙන් උපුටා ගත් කතා



සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.07



නිපුනතාවය - නාට්‍ය හා රංග කලාව විෂය බැඳි දේශීය විදේශීය සංස්කෘතික හා සාමාජීත පසුබිම ගවේෂණය කරයි.

නිපුනතා මට්ටම - ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි.

පාඩම - දෙමළ නාට්‍යකරුවෝ

කාලච්ඡේද - 02 (විනාඩි 80)

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01). 1903 - 1968 අතර කාලයේ දෙමළ නාට්‍ය කලාවට සුවිශේෂි දායකත්වය ලබා දෙන ලද්දේ,
1. මහාචාර්ය එස්. මෞනගුරු
2. මහාචාර්ය කේ. කනපතිපිල්ලේ
3. චෝර්ණලිංගම්
4. එම්. ෂන්මුගලිංගම්
5. මහාචාර්ය එස්. විද්‍යානන්දන්

(02). '' රාවනේසන් '' නාට්‍ය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වන්නේ,
1. කාන්තා චරිත පිරිමින් විසින් රගපෑම.
2. රාමායණය පදනම් කොට ගත්ත ද සීතාගේ චරිතය ඇතුලත් නොවීම.
3. මුල්ම දෙමළ ස්වතන්ත්‍ර නාට්‍ය වීම.
4. 1964 දී එස්. විද්‍යානන්දන් මෙම නාට්‍ය රචනා කිරීම.
5. සාම්ප්‍රදායික වඩමෝඩි ශෛලියේ ආභාෂය ලැබීම.

(03). මහාචාර්ය එස්. මෞනගුරුගේ නාට්‍ය නිර්මාණයක් වන්නේ,
1. රාවනේසන්
2. සංකරම්
3. උඩයාර් මිඩුක්කු
4. ද්‍රෝහියා
5. අන්නයි ඉට්ට කී

(04). ප්‍රථම ස්වත්‍රන්ත්‍ර දෙමළ නාට්‍ය නිර්මාණය වන්නේ,
1. එස්. මෞනගුරුගේ නාටක අරංකන් කල්ලූරි ය
2. මහාචාර්ය එස්. විද්‍යානන්දන්ගේ රාවනේසන් ය
3. කනපති පිල්ලේගේ උඩයාර් මිඩුක්කු ය
4. ෂන්මුගලිංගම්ගේ එන්තායුම් තායුම් ය
5. ෂන්මුගලිංගම්ගේ මන්සුවන්ත මේනියාර් ය

(05). 1978 'අරංකන් කල්ලූරි ' නම් නාට්‍ය ආයතනය පිහිටුවීමට මූලිකව කටයුතු කරන ලද්දේ,
1. කේ. කණපතිපිල්ලේ
2. එම්.අර්. රාධා
3. එස්. මෞනගුරු
4. එස්. විද්‍යානන්දන්
5. එම්. ෂන්මුගලිංගම්



සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.08



දිනය 2020.05.08

නිපුනතාවය - ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායන් ප්‍රකට කරයි.

නිපුනතා මට්ටම - චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

කාලච්ඡේද - 02 (විනාඩි 80)

පාඩම - සංස්කෘත නාට්‍ය රංග ශෛලියේ භාෂණ විධි

(01). චරිතයක් තමාගේ අභ්‍යන්තර හැඟීම් තාමාටම කියා ගන්නා අයුරින් ප්‍රකාශ කිරීම,
1. ස්වගත භාෂණය
2. ජනාන්තික භාෂණය
3. අපවාරිත භාෂණය
4. ප්‍රකාශ භාෂණය
5. ඒකල භාෂණය

(02). අපවාරිත භාෂණය යනු,
1. චරිතයක් ප්‍රේක්ෂයන් දෙසට හැරී ඔවුන්ට යමක් පවසන ආකාරයට භාෂණයේ යෙදීම.
2. චරිත කිහිපයක් වේදිකාවේ රැඳී සිටින අවස්ථාවක එක් චරිතයක් තවත් චරිතයකට පමණක් ඇසෙන ලෙස කතා කිරීම.
3. නළුවන් දෙනෙකු හෝ ඊට වැඩි ගණනක් එකම දෙබස එකම හඬකින් පැවසීම.
4. රහසක් කීම.
5. සාමාන්‍ය මනුෂ්‍ය කථනයට සමීපව කතා කිරීම.

(03). ජනාන්තික භාෂණය තුළ භාවිත වන මුද්‍රාව වනුයේ,
1. මුකුල මුද්‍රාව
2. ත්‍රිපතාක මුද්‍රාව
3. පතාක මුද්‍රාව
4. අර්ධ චක්‍ර මුද්‍රාව
5. අංජලි මුද්‍රාව

(04). ආත්මගත භාෂණය සඳහා භාවිතා වන තවත් වචනයක් වන්නේ,
1. ඒකල භාෂණය
2. ජනාත්තික භාෂාණය
3. ස්වයං කථනය
4. රහස් කථනය
5. අපවාරිත භාෂණය

(05). සංස්කෘත නාට්‍ය රංග ශෛලියේ භාවිත විවිධ භාෂණ,
1. පහකි
2. නවයකි
3. දොලසකි
4. අටකි
5. හතරකි

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

***Covid** 19 - සති පාසල් වැඩසටහන*

නාට්‍ය හා රංග කලාව

13 ශ්‍රේණිය - III වාරය

දිනය - 2020/05/04



***නිපුණතාව*** :- නාට්‍ය හා රංග කලාව විෂය හා බැඳි දේශීය හා විදේශීය සංස්කෘතික හා සමාජීය පසුබිම ගවේෂණය කරයි.

*නිපුණතා මට්ටම* :- ශ්‍රී ලංකාවේ දමිළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.** **කාලච්ඡේද - 2 යි (විනාඩි 80)**

**1)**

I. ශ්‍රී ලංකාවේ දෙමල නාට්‍ය කලාව බිහි වීම කෙරෙහි බලපෑ ද්‍රවිඩ ජනයාගේ සංස්කෘතික උත්සව 4 ක් නම් කරන්න.

II. ඉහත නම් කළ උත්සව වලින් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

III. දෙමළ පූජා කර්ම සහ සංස්කෘතික උත්සව වල දක්නට ලැබෙන පොදු නාට්‍යමය ලක්ෂණ කවරේදැයි විමසන්න.

**2)**

I. ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය කලාව **ප්‍රචලිත කලාප** කීයද? ඒ මොනවාද?

II. ඉන් තෝරාගත් කලාප දෙකකට ආවේනික නාට්‍ය ප්‍රභේද මොනවා දැ'යි වෙන් වෙන්ව දක්වන්න.

III. දෙමළ නාට්‍ය කලාවේ සංස්කෘතික උත්සව සඳහා භාවිත කළ **රංග භූමිය** සහ **අනුශාංගික** අංග පිළිබඳ විමසීමක් කරන්න.

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

***Covid** 19 - සති පාසල් වැඩසටහන*

නාට්‍ය හා රංග කලාව

13 ශ්‍රේණිය - III වාරය

දිනය - 2020/05/05



***නිපුණතාව*** :- නාට්‍ය හා රංග කලාව විෂය හා බැඳි දේශීය හා විදේශීය සංස්කෘතික හා සමාජීය පසුබිම ගවේෂණය කරයි.

*නිපුණතා මට්ටම* :- ශ්‍රී ලංකාවේ දමිළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.** **කාලච්ඡේද - 2 යි (විනාඩි 80)**

**1)**

I. ‘**කූත්තු**’ යන්න හඳුන්වන්න.

II. **‘නාට්ටු කූත්තු’** සම්ප්‍රදායේ දක්නට ලැබෙන ප්‍රභේදයන් හඳුන්වන්න ?

III. නාට්ටු කූත්තු සම්ප්‍රදායේ එන ‘**වඩමෝඩි** සහ **තෙන්මෝඩි** ශෛලීන් දෙකෙහි වෙනස්කම් සංසන්දනය කරන්න.

**2)**

I. උඩරට දෙමළ ජනතාව අතර ප්‍රචලිත නාට්‍ය සම්ප්‍රදාය නම් කරන්න.

II. ඉහත නම් කළ නාට්‍ය විශේෂයෙහි නිරූපණය කරනු ලබන කතා පුවත විස්තර කරන්න.

III. නාට්ටු කූත්තු නාට්‍ය සම්ප්‍රදායේ සංගීතය පිළිබඳ විමසීමක් කරන්න.

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Covid 19** *- සති පාසල් වැඩසටහන*
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය - III වාරය
දිනය - 2020/05/06



***නිපුණතාව*** :- නාට්‍ය හා රංග කලාව විෂය හා බැඳි දේශීය හා විදේශීය සංස්කෘතික හා සමාජීය පසුබිම ගවේෂණය කරයි.

*නිපුණතා මට්ටම* :- ශ්‍රී ලංකාවේ දමිළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.** **කාලච්ඡේද - 2 යි (විනාඩි 80)**

**1)**

I. විලාසන් නාට්‍ය සම්ප්‍රදායේ **ප්‍රභේද දෙක** නම් කරන්න.
II. විශ්ව විද්‍යාල දෙමළ නාට්‍ය කලාව සඳහා වස්තු විෂය කොට ගත් **තේමාවන්** පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
III. 1960 දශකයෙන් පසු දෙමළ නාට්‍ය කලාවේ දක්නට ලැබෙන නව ප්‍රවණතා පිළිබඳ විමසන්න.

**2)**

I. දෙමළ නාට්‍ය කලාව සංවර්ධනය කිරීමෙහි ලා දායක වූ නාට්‍ය කරුවන් තුන් දෙනෙකු නම් කරන්න.
II. නම් කරන ලද නාට්‍ය කරුවෙකු පිළිබඳ හැඳින්වීමක් කරන්න.
III. "1940-1950 දශකය දෙමල නාට්‍ය කලාවේ සුවිශේෂ අවධියකි" විමසන්න.

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
***Covid** 19 - සති පාසල් වැඩසටහන*
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය - III වාරය
දිනය - 2020/05/07



***නිපුණතාව*** :- නාට්‍ය හා රංග කලාව විෂය හා බැඳි දේශීය හා විදේශීය සංස්කෘතික හා සමාජීය පසුබිම ගවේෂණය කරයි.

*නිපුණතා මට්ටම* :- ශ්‍රී ලංකාවේ දමිළ නාට්‍ය කලාවේ පසුබිම හා විකාශනය විමසයි

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.** **කාලච්ඡේද - 2 යි (විනාඩි 80)**

**1)**

I. විශ්ව විද්‍යාල දෙමළ නාට්‍ය කලාව තුළ නව නාට්‍ය සම්ප්‍රදායක් ඇති කිරීමට දායක වූ නාට්‍ය කරුවා කවු ද?

II. මහාචාර්ය **විද්‍යානන්දන්** ගේ **රාවණේසන්** නාට්‍ය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

III. මහාචාර්ය **විද්‍යානන්දන් ගෙන්** මෙරට දෙමළ නාට්‍ය කලාවට සිදු කළ මෙහෙවර අගයන්න.

2)

I. නූතන දෙමල නාට්‍ය කලාවේ උන්නතිය උදෙසා 1978 බිහි වූ ආයතනය කුමක්ද?

II. **මහාචාර්ය S මෞනගුරු** ගෙන් දෙමළ නාට්‍ය කලාව සංවර්ධනය සඳහා සිදුවූ දායකත්වය කෙටියෙන් පැහැදිළි කරන්න.

III. බටහිර නාට්‍ය ආකෘතීන් සහ ශෛලීන් මෙරට දෙමළ නාට්‍ය කලාවට බලපෑ ආකාරය පැහැදිළි කරන්න.

සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

***Covid 19*** *- සති පාසල් වැඩසටහන*

නාට්‍ය හා රංග කලාව

13 ශ්‍රේණිය - III වාරය

දිනය - 2020/05/08



***නිපුණතාව*** :- ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් මූලික න්‍යායන් ප්‍රකට කරයි.

*නිපුණතා මට්ටම* :- චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.** **කාලච්ඡේද - 2 යි (විනාඩි 80)**

**1)**

I. පෙරදිග නාට්‍ය සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද? ඒ කුමන ග්‍රන්ථය ඇසුරින්ද?

II. ඔබ දන්නා සංස්කෘත නාට්‍ය 3 ක් නම් කොට ඒවායෙහි නිර්මාණකරුවන් නම් කරන්න .

III. සංස්කෘත නාට්‍යයෙහි රංග ශෛලියේ ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2)

I. සංස්කෘත නාට්‍යයේ දක්නට ලැබෙන **භාෂණ විධි** ගණන කීයද? ඒ මොනවාද?

II. **ප්‍රකාශ භාෂණය** හා **ආත්මගත භාෂණය** අතර ඇති වෙනස් කම් නිදසුන් සහිතව දක්වන්න.

III. භාෂණයක් ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු කවරේදැයි, පැහැදිලි කරන්න.